# 2016 ඔක්තෝම්බර් මාසය ඔබට කොහොමද?

මෙම මාසය උදා වන්නේ හිරු කන්‍යා රාශියේ සිටියදීය. මෙයින් ඔබගේ ජන්ම ලග්නයට අදාලව මෙම මාසයෙහි ග්‍රහචාරය සලකා කරුණු ඉදිරිපත් කරමි සෑම පුද්ගලයෙක්ටම ලග්නයක් හිමිය. ලග්නයට අනුව පලාපල දැනගැනීමට සෑමදෙනාම වාගේ කැමත්තක් දක්වයි.මෙය ලග්නයට අදාලව ඉදිරිපත් කරන පොදු විස්තරයක් බව සලකන්න ඔබේ ජන්ම කේන්දරයෙහි ග්‍රහයන් පිහිටා ඇති ආකාරය සහ ග්‍රහයන්ගේ බල දුබල බවත් දැනට ගත කරන්නාවූ මහ දසා අතුරු දසා අනුවත් පලාපල සැසඳිය යුතුය.




## මේෂ ලග්නය

**අමතර ආදායම්**

ආත්ම විශ්වාසයෙන් කටයුතු කර ජය අත්කර ගත යුතුවේ.තම දක්ෂතා සහ හැකියාවන් පිලිබඳව අවතක්සේරු නොකල යුතුය. අධ්‍යාපනයට සුළු හෝ බාධා ගෙනදීමේ ඉඩක් ඇත.ශරීරය උෂ්ණාධික විය හැක.රැකියාවට අමතර ආදායම් මාර්ග විවරවේ.




## කටක ලග්නය

**වික්‍රමාන්විත අදහස්**

වික්‍රමාන්විත අදහස් සහ ක්‍රියා ඇතිවේ.ඉගෙන ගන්නා වයසේ අයට ඉතා සුභ කාලයකි. කලබලකාරී ගති සහ අහංකාර ගති ඇති වීමටද ඉඩ ඇත. රැකියා සහ ව්‍යාපාර කටයුතු දියුණුවේ. හිතවතුන්ගේ කටයුතු සඳහා වෙහෙස වීමට සිදුවේ.




## තුලා ලග්නය

**නව නිර්මාණ**

සතුට තෘප්තිය ලබාගත හැක. ආදායම් ස්ථාවර වේ නව ව්‍යාපාර ඇරඹීමටත් ඉඩ ඇත. සිහින සඵලවන කථාවෙන් ජය ලැබෙන කාලයකි. නව නිර්මාණ සඳහා සුබදායකවේ. සමාජ ආගමික කටයුතු කෙරෙහි සිත ඇදී යනු ඇත. යම්යම් වගකීම් ලද හැක.




## මකර ලග්නය

**කැපී පෙනුමක්**

ඥාතිමිත්‍රයන් අතර කැපී පෙනුමක් ලබයි.ආදායම් තත්වය සරුවන කාලයකි.බොහෝදෙනා සමග සම්බන්ධවී කටයුතු කිරීමට ලැබේ. පදිංචි ස්ථානයෙන් දින කිහිපයකට හෝ ඈත්ව සිටීමට කරුණු යෙදීමට පුළුවන.ලැබීම් අතින් ගුණදායකවේ.




## වෘෂභ ලග්නය

**සමාජ කටයුතු**

පදිංචි ස්ථානයෙන් දින කිහිපයකට හෝ ඈත්ව සිටීමට කරුණු යෙදීමට පුළුවන.තමාගේ එදිනෙදා කටයුතු මද වශයෙන් හෝ වෙනස් විය හැක.ශාරීරික දුර්වලතා හෝ රක්ත දෝෂ බලපෑ හැක. සමාජ කටයුතු සඳහා සම්බන්ධවීමට සහ උපකාර කිරීමට උනන්දුවේ. .




## සිංහ ලග්නය

**කටයුතු බහුලවේ**

කටයුතු සඳහා උනන්දුවේ. නිතර හිතේ චංචල ගති සහ තීරණ වෙනස්වීම්යෙදේ. නෑ හිතවතුන්ගේ කටයුතු සඳහා වෙහෙස වීමට සිදුවේ. තමාගේ එදිනෙදා කටයුතු මද වශයෙන් හෝ වෙනස් විය හැකි කාලයකි. කටයුතු බහුල විය හැක.




## වෘශ්චික ලග්නය

**චංචල ගති**

නිතර හිතේ චංචලගති යෙදේ. ශරීරය වෙහෙසා කටයුතු කිරීමට අලස විය හැක.නමුත් බුද්ධිය වෙහෙසා කරන කටයුතුවලින් වැඩිදියුණුවක් ලගා කර ගැනීමට උත්සාහගනු ඇත. අධ්‍යාපනයට සුළු හෝ බාධා ගෙනදීමේ ඉඩක් ඇත. ශාරීරික දුර්වලතා බලපෑ හැක.




## කුම්භ ලග්නය

**වෙනත් ආදායම්**

විවේකී දිවිය ප්‍රිය කරනු ඇත ඉතා කිට්ටු හිතවතුන් පමණක් ආශ්‍රයට යොමුවේ.සෙම් රෝග යෙදීමට ඉඩ ඇත.තම බලාපොරොත්තු සඵල කර ගැනීමට බොහෝ උනන්දු වියයුතුවේ. බුද්ධිය වෙහෙසා කරන කටයුතුවලින් දියුණුවක් ලද හැක.




## මිථුන ලග්නය

**කටයුතුවලින් වාසි**

තම කටයුතුවලින් වාසි සැලසේ. දුර දිග බලා කටයුතු කරනු ඇත. උත්සාහයේ ප්‍රතිඵල වර්ධනය වනු ඇත.නව ඉගෙනීම් කටයුතු සඳහා මාර්ගසැලසේ.තමබලාපොරොත්තු බොහෝමයක් සඵලවේ.උසස් උගත් අය ආශ්‍රයට ලැබේ. බොහෝ දෙනා මුණගැසේ.




## කන්‍යා ලග්නය

**ලාභ ප්‍රශංසා**

බොහෝ වැඩිහිටි පිරිස් හඳුනා ගැනීමට ලැබේ.තම කටයුතුවලින් ලාභ ප්‍රශංසා ලද හැක. ඉගෙනීම් ලැබීමට සහ රැකියාවේ සුභදායී වෙනසකට ඉඩතිබේ. ශරීරය උෂ්ණාධික විය හැක.කටයුතු එකලෙස පවත්වා ගෙන යාම අසීරු විය හැක.




## ධනු ලග්නය

**බලාපොරොත්තු සඵලවේ**

තමදරුවන් වෙනුවෙන් නිර්ලෝභීව වියදම්කරයි. සමාජ කටයුතු සඳහා ඉදිරිපත්වේ. තම කටයුතු සඵලවේ. උගත් පිරිසක් ආශ්‍රයට ලැබේ.තාක්ෂණ අංශවල ඉගෙනීම් සඳහා නැඹුරුවක් ඇතිවේ. කලා අංශ සඳහා කැමැත්ත ඇත. රක්ත දෝෂ යෙදීමේ ඉඩක් ඇත.




## මීන ලග්නය

**දේව ඇදහිලි**

සිතුම් පැතුම් නිතර වෙනස්වේ. උත්සාහයේ තරමට ප්‍රතිඵල අඩුවේ කලබලකාරී ගති සහ අහංකාර ගති ඇති වීමටද ඉඩ ඇත. ආදායමට වඩා වියදම ඉහළ යනු ඇත. දේව ඇදහිලි සඳහාද හිත යෙදේ.වැඩිහිටි පිරිස් හඳුනා ගැනීමට ලැබේ.


*කේන්ද්‍ර සෑදීම ,පලාපල දැන ගැනීම, සුභ නැකැත් සහ නම් තැබීම ඇතුලු සියලුම ජ්‍යොතිෂ්‍ය කටයුතු සඳහා විමසන්න.*

*ප්‍රවීන ජ්‍යොතිර්වේදිනී වෛද්‍ය විනීතා විජේසූරිය*

*දුරකතනඅංකය:0430 666 727*

*ජීවිතය සඳහා ග්‍රහබලය නව වෙබ්අඩවිය www.chess6.com.au*

E-mail- *planetpower.life@yahoo.com.au*





***වෛද්‍ය විනීතා විජේසූරිය විසිනි.***